# ලොකු අත්තා

ෂෙනාලි අත්තනායක



මගේ හොඳම යාලුවා ලොකු අත්තයි. ඒ කියන්නේ මගේ අම්මාගේ අප්පච්චියි. ලොකු අත්තා හරිම හොඳයි. හරිම කරුණාවන්තයි. පොඩි කාලෙ ලොකු අත්තාගේ අම්මා නැතිවෙලා. එදා ඉඳලා ලොකු අත්තා හදාගෙන තියෙන්නේ ලොකු අත්තාගේ අම්මගේ අම්මාය.



අපි වෙනුවෙන් වෙහෙස වෙන මගේ ලොකු අත්තට මම හරිම ආදරෙයි.

හවස පාසල ඇරුනාම මාවත් අක්කිවත් පරිස්සමෙන් ගෙදර අරගෙන එන්නේ මගේ ලොකු අත්තයි.



ලොකු අත්තා මට හිස පීරන්න උදව් කරනවා. ඇඳුම් අන්දන්න උදව් වෙනවා. මගේ ඉස්කෝලේ ගේට්ටුව ගාවට ඇවිත් මාව එක්කරගෙන යන්නේ මගේ ලොකු අත්තයි.

මාගේ ඇඳුම් බෑගය හදන්නේ ලොකු අත්තා. මාව පරිස්සමෙන් පාසලට දාන්නේ ලොකු අත්තයි. මාගේ පිහිනුම් බෑගය හදන්නේ ලොකු අත්තයි. මමත් උදව් කරනවා.

මාව හැමදාම පිහිනුම් වලට පාන්දර 5.20ට එක්කන් යන්නේ ලොකු අත්තා.



ලොකු අත්තා මහනුවර සිල්වෙස්ටර් විදුහලේ තමයි ඉගෙන ගෙන තියෙන්නේ. ඒත් විශ්වවිද්‍යාලයට යන්න ලකුණු මදි වෙලා. අපට හොඳට ඉගෙන ගෙන විශ්ව විද්‍යාලයට යන්න කියලා හැමදාම එයා කියනවා.



කවදා හරි දවසක මම හොඳට ඉගෙන ගෙන දොස්තර නෝනා කෙනෙක් වෙලා මගේ ලොකු අත්තාගේ පොරොන්දුව ඉටු කරනවාමයි.

අනාගතේ ලස්සන කර ගන්න පුළුවන් එවිටලු. ඒ නිසා මම හොඳට ඉගෙන ගන්නවා. මගේ ලොකු අත්තාගේ ආසාව මම කොහම හරි ඉටු කරනවා.

මගේ ලොකු අත්තට බුදු සරණයි. දෙවි පිහිටයි.

